**පුත්තලම දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 18 - 2023**

---

**1. විගණන මතය**

**1.1** පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2023 වර්ෂයට අදාලව පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල තත්ත්වාගණනය කළ විගණන මතයන් ප්‍රකාශ කර තිබුණි. තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 18 ට අදාළ ගොඩ ඉඩම් අක්කර 24 පර්චස් 31ක්, පාංශු පරීක්ෂණ කට්ටල 18 ක් ගබඩා 12 ක්, කාර්යාලීය ගොඩනැඟිලි 06 ක්, නිල නිවාස 5 ක්, බීජ ගබඩාවක් හා එහි ඇති වායුසමීකරණ යන්ත්‍ර 02ක් හා පටක රෝපණාගාරයක් වශයෙන් වූ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සේවා මධ්‍යස්ථාන 6ක ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යොමුකර ඇති බවත් අනෙකුත් මධ්‍යස්ථානවල ගොඩනැගිලි සියල්ල ඉදිරියේ දී තක්සේරු කරවා ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව . | මූල්‍ය නොවන වත්කම් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා දෙකෙහි වෙන්දේසි කර හා වෙනත් ආයතන වෙත පවරා දී ඇති රු.762,618 ක් වටිනා යන්ත්‍රෝපකරණ හා වාහන මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | ගොයම් කපන යන්ත්‍ර 02 ක් වෙන්දේසි කර හා ට්‍රැක්ටරයක් කඩදාසි සමාගමට භාර දී ඇති අතර යන්ත්‍රෝපකරණ හා වාහන නවගත්තේගම ගොවිජන සේවා කාරක සභාවට භාර දී ඇති බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04ක් සඳහා දේශගුණ සුහුරු වාරි ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේ දී ලැබී තිබුණු වල් නෙළීමේ යන්ත්‍ර 08 ක්, ගොයම් පැළ සිටුවන යන්ත්‍ර 11ක්, බීජ සිටුවීමේ යන්ත්‍ර 4 ක් හා වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය මඟින් ලද ස්මාර්ට් රූපවාහිනී යන්ත්‍රයක් වශයෙන් මූල්‍ය | CSIAP ව්‍යාපෘතිය මඟින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී ඇති අතර එම ව්‍යාපෘති කාර්යාලය වෙතින් වටිනාකම් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

නොවන වත්කම් අයිතම 28 වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04 ක ගිණුම් විෂයයන් 10 කට අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් අනුරූපී වාර්තා සමඟ සැසඳීමේදී, එකතුව රු.1,336,875ක වෙනසක් පැවතුණි. | ඉදිරි වසරේ ගිණුම් වාර්තා සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නොසැසඳීම් සැසඳිය යුතුය. |

### 1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික සහ ණයහිමි කාල විශ්ලේෂණය වැනි සාක්ෂි නොමැති වීම හේතුවෙන් ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.49,302,963 ක වත්කම් විෂයන් 55 ක් හා එකතුව රු.22,913,124ක වගකීම් විෂයන් 16 ක් විගණනයේදී සතුටු දායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>53(4) වගන්තිය | සෑම වසර 03 කට වරක්ම කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, කාරක සභා 10 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කරන බව. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් | මුදල් හෝ තොග සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය දී ඇති සියලුම නිලධාරීන් ඇප තැබිය යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 17ක | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/2/15/3/3 (vii) හා | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 09 වගන්තිය | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණි. | 2023 ජනවාරි 23 දිනැති ලිපිය අනුව කෘ.ප.නි.ස.නිලධාරීන් ඇප මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කර ඇති බව. | කළ යුතුය. |
| (ඇ) | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ** | | | |
| (i) | 1994 මාර්තු 16 දිනැති අංක 392/94 දරන චක්‍රලේඛය | වෙනත් ආයතනවලින් හෝ පුද්ගලයින්ගෙන් අයවිය යුතු මුදල් නොපමාව අයකර ගතයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 12 ක වසර කිහිපයක සිට පැවත එන රු.5,930,746 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගො.සං.කො.ජනරාල්ගේ අංක 7/5/12/10/19 හා 2024 අප්‍රේල් 26 දිනැති ලිපියට අනුව රු.481,794.63 ක ශේෂයක් මේ වන විට අයකර ගැනීමට කාරක සභා වලට උපදෙස් දී ඇති බවත් ඉදිරියේදී චක්‍රලේඛ උපදෙස් අනුව ඉතිරි ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛයේ 5.6(i) වගන්තිය | ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 18ම එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලද විගස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | 2013 මාර්තු 08 දිනැති අංක 04/2013 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය උපයෝගී කර ගනිමින් ගොවි නිෂ්පාදන අලෙවිය, තාවකාලික ආපනශාලා පැවැත්වීම, ගොවි සංවිධානවල නිෂ්පාදන අලෙවි කිරීම වැනි කටයුතු කරන ලෙස උපදෙස් දී තිබුණද, ගොවිජන සේවා කාරක සභා 17ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි. | මේ වන විට ගොවිජන සේවා මධ්‍යස්ථාන 18 තුළම සිතමු කාන්තා ගොවි නිෂ්පාදන අලවි කිරීම, සතිපොළ පැවැත්වීම, වෙන්දේසි, සල්පිල් පැවැත්වීම වැනි අවස්ථාවන්ට ඉඩ ලබාදී ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 2020 ඔක්තෝම්බර් 08 දිනැති අංක 9/2020 දරන චක්‍රලේඛයේ 2.6.1 ඡේදය | සෑම ලියාපදිංචි ගොවි සංවිධානයක් විසින්ම ගොවි සංවිධානයේ ඉතිරි කිරීමේ ගිණුම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ විවෘත කර පවත්වාගෙන යාම හා ගොවි සංවිධානයේ සියළුම ගනුදෙනු එම ඉතිරි කිරීමේ ගිණුම හරහා සිදුකල යුතු වුවත් කාරක සභා 17 ක ලියාපදිංචි ගොවි සංවිධාන 638 කින් ගොවි සංවිධාන 436 ක් විසින් වෙනත් බැංකුවල රු.140,662,511 ක මුදල් තැන්පත් කර තිබුණි. | අදාළ බල ප්‍රාදේශවල ප්‍රාදේශිය නිලධාරින් විසින් ගොවි සංවිධාන වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර මේවන විට මුදල් තැන්පත් කිරීම් වර්ධනය කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.21,470,908 ක ශුද්ධ අතිරික්තයක්ද, ගොවිජන බැංකු 18 හි එකතුව රු. 13,505,619ක අතිරික්තයක්ද වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.10,006,805 ක ශුද්ධ අතිරික්තයක්ද ගොවිජන බැංකු 18 හි එකතුව රු.10,807,301ක අතිරික්තයක්ද විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

i. සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 16 ක රු.22,010,149 ක අතිරික්තයක් තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 16ක අතිරික්තය රු.10,311,610ක් වූයෙන් රු.11,698,539 ක අතිරික්තයේ වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක සභා 02 ක ඌනතාවය රු.539,241ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක සභා 02 ක ඌනතාවය රු.304,805 ක් වූයෙන් රු.234,436ක ඌනතාවයේ වැඩිවීමක් දක්නට ලැබුණි.

ii. පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ, පැල, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීමට අදාල සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි මුළු අලෙවි ආදායම එකතුව රු.149,936,017ක් ද මුළු දළ ලාභයේ එකතුව රු.11,829,039ක්ද විය. ඒ අනුව ගොවිජන සේවා කාරක සභා 18 හි සමස්ථ දළ ලාභ අනුපාතය සියයට 8 ක් වී තිබුණි.

iii. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 18 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| | | ------------- |
| ➢ සමුච්චිත අරමුදල්වල වටිනාකම (ශුද්ධ වත්කම්) | = | 155,214,101 |
| ➢ දිගුකාලීන ණය වටිනාකම | = | 21,792,754 |
| ➢ ජංගම බැරකම් | = | 225,563,688 |
| ➢ මුළු වත්කම් | | |
| • ජංගම වත්කම් | = | 284,970,282 |
| • ජංගම නොවන වත්කම් | = | 117,600,261 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අතිරික්ත මුදල් ආයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 18 හා ගොවිජන බැංකු 18 විසින් එකතුව රු.14,622,167 ක් ඵලදායීව ආයෝජනය කිරීමෙන් තොරව රජයේ වාණිජ බැංකු 2 හි ජංගම ගිණුම්වල රඳවාගෙන තිබුණු අතර, එකතුව රු.47,613,091ක මුදලක් අඩු පොලී ආදායමක් ලැබෙන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඒ අනුව අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | කාරක සභාවේ ගණුදෙනු හා ගොවීන්ගේ අවශ්‍යතා වලට ගිණුම්වල මුදල් පවත්වාගනු ලබන බව. | අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 18 විසින් පරිගණක මෘදුකාංග වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.308,358 ක් සහ ගොවිජන බැංකු නිලධාරීන් පුහුණු කිරීම වෙනුවෙන් රු.183,042 ක් සමාලෝචිත වර්ෂයේදී ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට ගෙවා තිබුණද, එම ව්‍යාපෘති මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයේ මඟපෙන්වීම යටතේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | නොපමාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාදම්පේ ගොවිජන සේවා කාරක සභාවේ 2009 වර්ෂයේදී අලෙවි අංශයේ සේවයේ නියුතුව සිටි අලෙවි සේවිකාවක විසින් සිදු කර තිබුණු මූල්‍ය අක්‍රමිකතාවක් හේතුවෙන් අයකර ගතයුතු රු.2,110,289 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | නිරීක්ෂණ පිළිගන්නා බව . | මූල්‍ය අක්‍රමිකතාවයට අදාළ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියදි පරික්ෂාවට අනුව ගොවිජන සේවා කාරක සභා 05 කට අයත් වැව් හා අමුණු මැනුම් කර ඊට අදාල භූමි ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුත්තලම දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග 1651 ක ප්‍රමාණයක් ඇති අතර ඉන් ගැටළු සහගත ඒවායේ මැනුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව හරහා සිදු කර ගෙන ඇති බවත් ඉතිරි මැනුම් කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු කළමනාකරණ ඒකකය මඟින් සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | කාරක සභාවලට අයත් වැව් හා අමුණු මැනුම් කර ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභාවල 2023 යල කන්නයේ වගා කටයුතු 2023 මාර්තු මස ආරම්භ කර තිබුණ ද, එම කන්නය සඳහා රු.297,348,000ක වටිනාකමක් සහිත පොහොර සහනාධාර වවුචර් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයෙන් 2023 ජුනි මස ලබාදී තිබුණි. ඒ අනුව සහනාධාර පොහොර වවුචර් යටතේ ලබාදෙන ලද යූරියා හා MOP පොහොර කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශයන්ට අනුකූලව නියමිත කාලයේදී යෙදිය නොහැකි වී තිබීමෙන් සහනාධාර පොහොර වැඩසටහනින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | ඉදිරියේදී මෙම දුර්වලතාවයන් මඟහරවාගැනීම සඳහා අදාළ ඉහළ අංශ දැනුවත් කිරීමට කටයුතු කරන බව. | අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකි ආකාරයට නියමිත කාලය තුළ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා බල ප්‍රදේශයන්හි අස්වැන්න පිළිබඳ තොරතුරු සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමයට අස්වනු සමීක්ෂණ මඟින් ලබාගත් තොරතුරු නොවූ අතර ඒ ඒ වසම් භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ලබාදෙනු ලබන ආසන්න තොරතුරු මත සකස් කර තිබුණි. ඒ අනුව එම තොරතුරුවල විශ්වසනීය බව අඩු විය. | සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර, අඩුපාඩු සමීක්ෂණය කරවීම සඳහා කෘ.ප.නි.ස මට්ටමින් ක්‍රියාත්මක කරවීමට ඉදිරි කටයුතු කරන බව. | සත්‍ය දත්ත මත පදනම්ව තොරතුරු, වාර්තා පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සේරුකැලේ ගොවිජන සේවා කාරක සභාවේ 2023 වර්ෂයට අදාළව රු.84,080 ක් සහ 2022 වර්ෂයට අදාළව රු.54,340 ක්ද, රාජකදළුව ගොවිජන සේවා කාරක සභාවේ 2023 වර්ෂය සඳහා රු.48,670 ක් අක්කර බදු අය වීමට තිබුණි. | කොටසක් 2024 වර්ෂය තුළ අයකර ගෙන ඇති අතර, ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | හිඟ අක්කර බදු නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දිස්ත්‍රික්කය තුළ සමාලෝචිත වර්ෂය අවසාන දිනට වී වගා කල හැකි A ශ්‍රේණියේ කුඹුරු ඉඩම් අක්කර 265.87 ක්ද, වෙනත් භෝග වගා කල හැකි B ශ්‍රේණියේ කුඹුරු ඉඩම් අක්කර 873.27 ක් හා වගා කළ නොහැකි C ශ්‍රේණියේ කුඹුරු ඉඩම් අක්කර 960 ක් පුරන්ව පැවතුණි. | වගා කළහැකි කුඹුරු ඉඩම් වගාකර වීමට කටයුතු කර ඇති අතර, වගාකල නොහැකි කුඹුරු පුරන්ව පවතින බව. | කුඹුරු ඉඩම් ඵලදායීව වගා කටයුතු සඳහා යොදා ගත යුතුය. |
| (උ) | 2 KR - 2006, 2008, 2010 ව්‍යාපෘතිය යටතේ රු.250,000 බැගින් අත්ට්‍රැක්ටර් 93 ක් ද රු.200,000 බැගින් අත්ට්‍රැක්ටර් 25 ක් ද වශයෙන් අත්ට්‍රැක්ටර් 118 ක් ගොවි මහතුන් 118 දෙනෙකු වෙත ණය පදනම මත ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවි මහතුන් 50 දෙනෙකුගෙන් රු.5,685,420 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. මුදල් ගෙවා අවසන් වුවද ගොවීන් වෙත පවරා නොතිබුණු අත්ට්‍රැක්ටර් ප්‍රමාණය 46 ක් විය. තවද අලුත්වැඩියා කිරීම සඳහා අමතර කොටස් වෙළඳපලෙහි නොතිබීම මත ට්‍රැක්ටර් බොහොමයක් වර්තමානය වන විට නිශ්කාර්යව පැවතුණි. | 2024 ජූලි 15 දිනට පෙර හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශිය නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බවත් හිඟ මුදල් සහිත ට්‍රැක්ටර් රථ නැවත පවරා ගෙන ටෙන්ඩර් මඟින් විකුණා අදාළ මුදල් අයකර ගැනීමටත් ගෙවා අවසන් ගොවින්ගේ ට්‍රැක්ටර් පවරා දීමටත් කටයුතු කරන බව. | හිඟ ණය අයකර ගැනීමටත්, පවරා නොමැති අත්ට්‍රැක්ටර් පවරා දීමටත්, අළුත්වැඩියාව සඳහා අමතර කොටස් ගෙන්වා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ඇති පාලකුඩාව ගොවිජන සේවා කාරක සභා ඉඩම තුළ අඩි 12 x 14 ප්‍රමාණයක විද්‍යුත් දත්ත සන්නිවේදන සමාගමක, සම්ප්‍රේෂණ බෙදා හැරීමේ උපාංග ඉදි කර තිබුණද ඒ වෙනුවෙන් කිසිදු ගාස්තුවක් රජයට හෝ ගොවිජන සේවා කාරක සභාවට ලබා ගෙන නොතිබුණි. | සමාගමෙන් විමසීම් කර ලිපියක් යොමු කරන ලෙස මධ්‍යස්ථාන භාර නිලධාරි දැනුවත් කර ඇති අතර ඒ අනුව අයවීම් සම්බන්ධව කටයුතු සිදු කරන බව. | විධිමත් පරිදි අදාළ සමාගමෙන් ගාස්තු අයකර රජයේ ආදායමට බැර කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික්කය තුළ 2021 යල කන්නයේ දී ගොවීන් සඳහා නොමිලයේ බෙදා දීමට ලද පොහොර තොගයෙන් TSP කිලෝග්‍රෑම් 3118 ක්, ERP කිලෝග්‍රෑම් 5600 ක් සහ MOP කිලෝග්‍රෑම් 3078 ක්ද, කාරක සභා දෙකක 2022 යල කන්නයට අදාල ERP පොහොර කිලෝග්‍රෑම 9450 ක්, කාබනික දියර පොහොර ලීටර් 843 ක් සහ ජෛව දියර පොහොර ලීටර් 1780 ක් ද, නයිනමඩම කාරක සභාවේ 2020 සහ 2021 වර්ෂයේ දී ලද MOP කිලෝග්‍රෑම් 112 ක් සහ KCL කිලෝග්‍රෑම් 417 ක් සහ මදුරන්කුලිය කාරක සභාවේ 2021/2022 මහ කන්නයේදී බෙදාහැරීමට ලද MOP කිලෝග්‍රෑම් 1527 ක් ද භාවිතා කිරීමෙන් තොරව ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ උපදෙස් අනුව ක්‍රියාකරන බව. | අදාළ පොහොර තොග කල් ඉකුත්වීමට පෙර ගොවීන්ට නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2012 වර්ෂයේදී වර්ල්ඩ් විෂන් ආයතනයේ මැදිහත්වීමෙන් වනාතවිල්ලුව ගොවිජන සේවා කාරක සභාවේ ඉදි කරන ලද පටක රෝපණාගාරය ඌන උපයෝජිතව පවත්වා ගෙන යනු ලබන අතර 2012 වර්ෂයේ සිට මේ දක්වා එහි ආදායම හා වියදම සැසඳීමේදී. රු.1,056,526 ක මූල්‍ය ප්‍රතිඵලයේ සමුච්චිත පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. | පටක රෝපණාගාරයේ බිම් මල් වගාකිරීම සඳහා ඉදිරි කටයුතු කරන බව. | වත්කම් පූර්ණ උපයෝජනය සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

## 3.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩාවැව ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් දළ ඇස්තමේන්තු පිරිවැය රු.මි.3.5 ක් වූ ඉ/හත්තිනි වැවේ සොරොව්ව හා ඇළ පැති බැම්ම ඉදි කිරීමේ ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණ අතර මල්විල වැව හා රාල්මඩුව වැව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2022 වර්ෂයේදී වනාතවිල්ලුව ගොවිජන සේවා කාරක සභාවට රු.300,864 ක් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබාදී තිබුණද, අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර නොතිබුණි. | අදාළ සුළු වාරිමාර්ග සංවර්ධන කටයුතු සිදු කරන තෙක් අදාළ මුදල් ගොවිජන සේවා කාරක සහා ගිණුම්වල තැන්පත් කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබාදී ඇති බව.. | වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කටයුතු නියමිත කාලය තුළ ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 15 ක් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදයට අනුකූල නොවන පරිදි මිල කැඳවීමකින් තොරව ඍජු මිලදී ගැනීම් ලෙස තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් බිත්තර වී, පොහොර, කෘෂි උපකරණ, බීජ හා ලිපිද්‍රව්‍ය පිළිවෙලින් රු.6,110,025ක්, රු.84,110,897ක්, රු.183,850ක්, රු.356,622ක් සහ රු.97,020ක් මිලදී ගෙන තිබුණි. | ඉදිරියේ දී ප්‍රසම්පාදන මූලධර්මයන්ට අනුව කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනය කළ යුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.2 වගන්තියේ විධිවිධාන අනුව තෘප්තිමත් සේවයකට ඉඩසැලසීම සඳහා සුදුසු මාරුවීමේ ක්‍රමවේදයක් ඇති කලයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 18 හි අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියක් යටතේ ස්ථාන මාරුවීම් සඳහා යටත් නොකිරීම නිසා එකම සේවා ස්ථානයක දීර්ඝකාලයක් සේවය කර තිබුණි. | ඉදිරියේදී ගොවිජන සං.කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමු කරන බව. | විධිමත් ස්ථානමාරු ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තු අනුව ගොවිජන සේවා කාරක සභා 18 හි ආදායම් හා වියදම් විෂයයන් 129 ක් සඳහා සියයට 0.33 සිට සියයට 1531ක පරාසයකින් විචලනයන් පැවතුණි. මේ හේතුවෙන් පාලන ක්‍රමවේදයක් ලෙස යොදා ගනු ලබන අයවැය ලේඛන සඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි. | 2024 වර්ෂය තුල නිරවුල් ඇස්තමේන්තු පිළියෙල කිරිමට උපදෙස් ලබාදී අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමටත් ඒ අනුව වියදම් පාලනය කිරීමත් කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව පිහිටුවීමේ සිට මේ දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස පවතින අතර එය ජාතික වශයෙන් පිළිගත් විධිමත් බැංකු පද්ධතියක් ලෙස නියාමනය වන ආකාරයට සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉල්ලීම් ගොවිජන සේවා කාරක සභා විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත යොමු කර නොතිබුණි. | ඉදිරියේදී ගොවිජන සං.කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමු කරන බව. | පිළිගත් බැංකු පද්ධතියක් ලෙස නියාමනය සිදු කර ගැනීමට අවශ්‍ය ඉල්ලීම් කළ යුතුය. |
| (ආ) | මාදම්පේ ගොවිජන බැංකුව විසින් වාරි දිරිය සංවර්ධන වැඩසටහන යටතේ 2021 සැප්තැම්බර් 27 දින ගොවි සංවිධානයකට ලබාදෙන ලද රු.1,000,000 ක අත්තිකාරම් මුදල්, ඉදිකිරීම් අවසානයේ දිස්ත්‍රික් කාර්යාලය මඟින් බිල්පත් පියවීමේදී අඩුකර නොගැනීම හේතුවෙන් 2024 ජනවාරි 02 දිනට රැඳවුම් මුදල්ද, හිලව් කලපසු තවදුරටත් රු.428,102 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පුත්තලම් දිස්ත්‍රික් ගොවිජන විනිශ්චය සභාව වෙත මෙම ණය අයකර ගැනීම සඳහා යොමු කර ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොවීන්ට ලබාදී තිබුණු එකතු වටිනාකම රු.8,755,000 ක් වූ ව්‍යාපෘති හා ව්‍යවසායක ණය 67 ක ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ව්‍යාපෘති 31 ක් විගණිත දිනය වන තෙක් ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘති 13 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක් පමණ විය. ඒ අනුව ණය ලබා දීමෙන් පසු, පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ආදායම් වියදම් සම්බන්ධ වාර්තා තබා ගැනීම සඳහා ගොවීන්ට මඟපෙන්වීමක් ද කර නොතිබුණි. | අදාළ ප්‍රාදේශිය නිලධාරින් වෙත ලිඛිතව පසුවිපරම් සිදු කරන ලෙස දන්වා ඇති අතර ණය වාරික අයකර ගැනීමට කටයුතු කරන ලෙස ද දන්වා ඇති බව. | ණය ලබා දීමෙන් පසු පසුවිපරම් කිරීමට හා උපදෙස් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 ක වසම් 485 ක් සඳහා වගා ණය, ව්‍යාපෘති ණය, ව්‍යවසාය ණය හා වෙනත් ණය ලබාදීම් පරීක්ෂා කිරීමේදී වසම් 260 කට එනම් සියයට 53 කට කිසිදු වර්ගයක ණය මුදලක් ලබා දී නොතිබුණි. | 2024 වර්ෂය තුළ දිස්ත්‍රික්කයේ සෑම වසමකම ණය ක්‍රමවේදය ක්‍රියාත්මක කර ණය ලබා දීමටත් ඔවුන්ගේ අදායම් වර්ධනය කර ණය අයකර ගැනීමටත් මෙවන විට කටයුතු කර ඇති බව. | සියලු වසම් ආවරණය වන පරිදි ණය නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 18 හි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවීන් 1471 දෙනෙකුට ලබා දී තිබුණු කෘෂි ණය, ව්‍යාපෘති ණය, ව්‍යවසාය ණය සහ වෙනත් ණය එකතුව රු.55,368,217 ක් වූ මාස 6 සිට වර්ෂ 20ට වැඩි කාලයක් කල් පසුවී ඇති හිඟ ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | කල්පසු වී ඇති හිඟ ණය අයකර ගැනීම සඳහා දිස්ත්‍රික් ගොවිජන විනිශ්චය සභාව සහ මහේස්ත්‍රාත් අධිකරණය වෙත හිඟ ණයකරුවන් යොමු කර ඇති බව. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |